පුවත්පත් වාර්තාකරණයේදී පාඨකයා යම් පුවතක් කෙරේ ආකර්ශණය කරගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කිරීම ඉතා සුලභව දක්නට ලැබේ. පුවත් භාවාතිශය ලෙසින් දැක්වීමද (Sensationalism) මින් එකක් ලෙස හඳුනාගත හැක. කෙසේ වෙතත්, අපරාධයක් වැනි පුවතක් වාර්තා කිරීමේදී, භාවාතිශය දැක්වීම් නුසුදුසු බව මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ කතිකාවන්හි දැක්වෙන්නේ, එතුළින් ඇතැම් විට සිදුවීමට අදාළ සත්‍ය කරුණු වලට වඩා අතිශයෝක්තියක් උත්පාදනය විය හැකි බැවිනි. එසේම භාවාතිෂය වර්ණයකින් ඉදිරිපත් වන පුවත් වාර්තාවක් ඔස්සේ, සිදුවීමෙහි බරපතලකම මෙන්ම, ඒ පිළිබඳ සියුම් කාරණා පාඨක ග්‍රහණයට හසු නොවී යා හැක.

අරුණ පුවත්පත (11/02) සහ දිවයින පුවත්පත (11/02) මනුෂ්‍ය ඝාතන සිද්ධියක් පිළිබඳ පුවතක් ආකාර දෙකකින් වාර්තා කොට තිබුණි. අරුණ පුවත්පත විශේෂයෙන් පුවත සඳහා කාටූනයක්ද භාවිතා කර තිබුණි.

1) මෙම පුවත් වාර්තාවන් අතුරින්, ඔබට අනුව භාවාතිෂය ආකාරයක් ගන්නේ කුමන පුවත් වාර්තාවද?

2) මෙම පුවත් වාර්තාවන් අතුරින්, එකකින් හෝ මනුෂ්‍ය ඝාතන සිදුවීමක් සැහැල්ලු කොට දැක්වීමක් සිදුවී ඇතැයි ඔබ සිතන්නේ ද?

3) ඒ අයුරින් බලන විට, මෙතැනින් ඔබ තෝරා ගන්නා පුවත් වාර්තාව කුමක්ද?

මූලාශ්‍ර:
https://www.poynter.org/.../5-tips-on-how-to.../